චක්‍රලේඛ අංක : ජාගොපස 2011/1

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
498, ආර්.ඒ. ද මැල් මාවත
කොළඹ 03

2011.02.10

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දිසාපති/දිස්ත්‍රික් ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
ප්‍රාදේශීය ලේකම්වරුන් සහ
පළාත් පාලන ආයතන ප්‍රධානීන්

**<u>නායයෑම් වලට ලක්විය හැකි ප්‍රදේශවල කවර හෝ ඉදිකිරීමක් සිදුකිරීමට ප්‍රථම ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ යෝග්‍යතා සහතිකය/නිර්දේශ ලබාගැනීම</u>**

1. පසුගිය දශකය තුළ මෙරටෙහි නායයෑම් අවධානම් දිස්ත්‍රික්ක ලෙස හඳුනා ගෙන ඇති නුවරඑළිය, බදුල්ල, මහනුවර, මාතලේ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, කෑගල්ල සහ රත්නපුර යන දිස්ත්‍රික්කවල නායයෑම් හේතු කොට ගෙන අහිමි වූ ජීවිත, හානියට පත් දේපල සහ විනාශයට ලක්වූ යටිතල පහසුකම්වල සීඝ්‍ර වර්ධනයක් දක්නට ඇත. මේ සඳහා විශේෂයෙන්ම බලපා ඇත්තේ අවිධිමත් භූමි පරිහරණය හා අස්ථාවර බෑවුම්වල සිදුකරනු ලබන අක්‍රමවත් ඉදිකිරීම්/ සංවර්ධන ක්‍රියාකාරකම් බවට හඳුනාගෙන ඇත.

2. නායයෑම් වැළැක්වීමේ සහ අවම කිරීමේ ක්‍රියාමාර්ගයන් තුලින් ජනතාවට සහ දේපලවලට සිදුවන හානිය අවම කර ගැනීම සඳහා නායයෑම් අවධානම් සහිත විශේෂයෙන් ඉහත ඡේදයේ දක්වා ඇති දිස්ත්‍රික්කවල <u>කවර හෝ ඉදිකිරීමේ</u> කාර්යයක් ආරම්භ කිරීමට පෙර මේ සම්බන්ධයෙන් තාක්ෂණික දැනුම සහ අවශ්‍ය පහසුකම් වලින් හෙබි, වගකීම පැවරී ඇති රාජ්‍ය ආයතනය වන ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් යෝග්‍යතා සහතිකයක්/නිර්දේශය ලබා ගැනීම අනිවාර්ය කල යුතු බවට 2011.01.05 වන දින ගරු අමාත්‍ය මණ්ඩලය තීරණය කොට ඇත.

3. මින් ඉදිරියට සිදුකරනු ලබන්නාවූ කවර හෝ ඉදිකිරීමක් සිදුකිරීමට පෙර ඒ සඳහා වන අවසරය ලබා දීමට පෙර ඉහත පළමු ඡේදයේ නම්කර ඇති දිස්ත්‍රික්කවල සියළු මහනගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා සහ ව්‍යාපෘති අනුමත කරන ආයතන විසින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් අදාල යෝග්‍යතා සහතිකය/ නිර්දේශය ලබා ගැනීම අනිවාර්යයෙන්ම සිදු කල යුතුය.

4. ඉදිකිරීම සිදුවන අවස්ථාවේදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ලබා දෙනු ලබන නිර්දේශය අනුව ඉදිකෙරෙන්නේදැයි පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් අදාල මහනගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා සහ ව්‍යාපෘති අනුමත කරන ආයතන විසින් සකස් කර ගත යුතු අතර ඉදිකිරීම අවසන් කල පසු අනුකූලතා සහතික නිකුත් කිරීමේදී එම නිර්දේශ ක්‍රියාත්මක කර ඇත්දැයි අවධානයට ලක්කිරීම අනිවාර්ය වේ.

5. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශ/ යෝග්‍යතා සහතිකයකින් තොරව කවර හෝ ඉදිකිරීමක් සඳහා අනුමැතිය ලබා දී ඇත්නම් එම අනුමැතිය ලබා දීමට කටයුතු කල නගරාධිපති/ සභාපති, ලේකම්වරයා ඇතුළු අනුමත කිරීමේ කමිටුව සහ ව්‍යාපෘති අනුමත කරන්නාවූ බලධාරීන් පෞද්ගලිකවම වගකිව යුතු වේ. ඒ අනුව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශ/ යෝග්‍යතා සහතිකයක් නොමැතිව ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාදීමෙන් අනතුරුව යම්කිසි හානියක් සිදුවුවහොත් සිදුවී ඇති හානියේ වටිනාකම අදාල පාර්ශ්වයට හෝ රජයට ගෙවීම සඳහා නගරාධිපති/සභාපති, ලේකම්වරයා ඇතුළු කමිටුව සහ ව්‍යාපෘති අනුමත කරන්නාවූ බලධාරීන් පෞද්ගලිකවම වගකීමට බැඳේ. එවැනි තත්ත්වයකදී සිදුවූ හානියේ වටිනාකම අදාල පාර්ශ්වයන්ට නොගෙවනු ලදහොත් අදාල වටිනාකම අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගනු ලැබේ.

6. මෙම චක්‍රලේඛය 2011.02.15 වන දින සිට වලංගු වන අතර මේ සම්බන්ධයෙන් අදාල නිලධාරීන් දැනුවත් කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකල යුතුය.

එස්.එම්. මොහොමඩ්
ලේකම්
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

පිටපත : 1. ජනාධිපති ලේකම්
2. අමාත්‍ය මණ්ඩල ලේකම්
3. භාණ්ඩාගාර ලේකම්
4. ආරක්ෂක ලේකම්
5. පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ලේකම්
6. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්
7. විගණකාධිපති